# 2 දේශක දිවැසිවරු

සත්‍යයට සාක්ෂි දරමින් දෙවියන් වහන්සේ වෙනුවෙන් කතා කළ පුද්ගලයෝ පැරණි ගිවිසුමේ වූහ. ඔවුන් දිවැසිවරු ලෙස හැඳින්වේ. දේශක දිවැසිවරු එම කාර්යය මැනවින් ඉටු කළහ. මෙම දේශක දිවැසිවරුන් තිදෙනෙක් පිළිබඳ ව අපගේ අවධානය යොමු කරමු.

1. නාතාන් දිවැසිවරයා
2. එලියා දිවැසිවරයා
3. එලිෂා දිවැසිවරයා

## නාතාන් දිවැසිවරයා



2.1 රූපය - නාතාන් දිවැසිවරයා

දවිත් රජතුමා උරියාගේ බිරිඳ වූ බැත්-ෂෙබා සමග නොමනා ලෙස හැසුරුණේ ය. දාවිත් රජතුමාට නාතාන් දිවැසිවරයා උපමාවක් මගින් කතා කරමින් ඔහුගේ වරද පහදා දුන්නේ ය. නාතාන් දිවැසිවරයාගේ මෙම ක්‍රියාව නිසා දාවිත් රජතුමා තම වරද වටහාගෙන මනස්ථාප විය. (2 සාමුවෙල් 12:1-15)

නාතාන් දිවැසිවරයා උපක්‍රමශීලි ව දාවිත් රජතුමා කළ වරද පෙන්වා දෙමින් ඔහු ව යහමගට ගත්තේ ය. සිසු දරුවන් වන අප ද කෙනෙක් වරදක් කරන අවස්ථාවේ දී ඔහුගේ හෝ ඇයගේ සිත නොරිදවා එය පහදා දී ඔහු හෝ ඇය යහමගට ගත යුතු ය.


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## එලියා දිවැසිවරයා



2.2 රූපය - එලියා දිවැසිවරයා

එක්තරා නියඟයක දී එලියා දිවැසිවරයා කෙරිත් ඔය ළඟ වාසය කළේ ය. කපුටෝ ඔහුට මස් හා රොටි ගෙනැවිත් දුන්නෝ ය. අනතුරු ව ඔහු ශාරෙපත් නගරයෙහි ජීවත් වූ වැන්දඹුවගේ නිවසට ගියේ ය. ඇයගේ නිවසේ තිබුණේ පිටි මිටක් හා තෙල් මිටක් පමණි. එහෙත් නියඟය නිම වන තුරු එම පිටි ටික හා තෙල් ටික අවසන් නොවී ය. (1 රාජාවලිය 17:1-16)

අප අසරණ වන අවස්ථාවල දෙවියන් වහන්සේගේ ආශිර්වාදය තුළ විවිධ වරප්‍රසාද ලබා අපගේ ජීවිතය සුරක්ෂිත වීම "දිව්‍ය සංරක්ෂණය" යනුවෙන් හැඳින්වේ. ඒ අනුව එලියා දිවැසිවරයා නියඟයේ දී දිව්‍ය සංරක්ෂණය අත්දුටුවේ ය.

## කාර්මෙල් කන්ද මත පූජාව



2.3 රූපය - කාර්මෙල් කන්ද මත පූජාව

කාර්මෙල් කන්ද මත එලියා දිවැසිවරයා හා බාල් දෙවියන්ගේ දිවැසිවරු යාග දෙකක් සූදානම් කළහ. සැබෑ දෙවියන් වහන්සේ ගින්නක් එවා යාගය දැවීමෙන් යාගය බාර ගන්නා බවට පිළිගැනිණි. බාල් දෙවියන්ගේ දිවැසිවරු යාච්ඤා කළත් ඔවුන්ගේ යාගය ගින්නෙන් නොදැවිණි. එලියා දිවැසිවරයා යාගයට ජලය වත්කොට යාච්ඤා කළත් එය දැවී ගියේ ය. එයින් සැබෑ දෙවියන් කවුරුන්දැයි ඔප්පු විණි. (1 රාජාවලිය 18:21-39)

කාර්මෙල් කන්ද මත කළ දවන පූජාව අවසාන වීමත් සමග ම නියඟය නිම වී වැස්ස වහින්නට පටන් ගත්තේ ය. දෙවියන් වහන්සේ තමන් වහන්සේ කෙරෙහි විශ්වාසය තබන අය ආරක්ෂා කරන සේක. එමෙන් ම ඔවුන්ගේ අවශ්‍යතාවල දී සහාය වන සේක. එබැවින් අප ද එදිනෙදා ජීවිතය තුළ දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය තබා දිව්‍ය සංරක්ෂණය පතා යාච්ඤා කළ යුතු ය.

## එලිෂා දිවැසිවරයා



2.4 රූපය - එලිෂා දිවැසිවරයා

ගවයන් දොළොස් බානක් පිටුපස හාමින් සිටි එලිෂා ළඟට එලියා දිවැසිවරයා ගොස් සිය සළුව ඔහු පිට හෙළා ඔහු කැඳවී ය. එලිෂා එලියා අනුව යමින් දිවැසිවරයකු ලෙස සේවය කළේ ය. (1 රාජාවලිය 19:19-21)

## නාමන්ගේ කුෂ්ඨය සුව කිරීම



2.5 රූපය - කුෂ්ඨය සුව කිරීම



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

සිරියාවේ රජතුමාගේ සෙන්පතියා වූ නාමන්ගේ කුෂ්ඨය එලිෂා දිවැසිවරයා සුව කළේ ය. එසේ කළේ මුළු පොළොවේ වෙන දෙවි කෙනෙක් නැති බව ඔහුට පහදා දීමට ය. එමෙන් ම නාමන් සෙන්පතියාගේ උඩගුකම ද තුරන් කළේ ය. (2 රාජාවලිය 5:1-19)

යාච්ඤා කිරීම තුළින් අපට සුවය අත්දැකිය හැකි ය. යාච්ඤාව අපේ ජීවිතයට බලවත් ශක්තියකි. යාච්ඤාවෙන් තොර ජීවිතය සාර්ථක නොවේ. එමෙන් ම එක ම දෙවියන් වහන්සේට පමණක් වන්දනාමාන කළ යුතු ය. දස පනතේ පළමුවන පනත අනුසාර කිරීම අපේ වගකීම යි.

**ක්‍රියාකාරකම**

1. 2 සාමුවෙල් 12:1-7 කියවා එහි ඇති උපමාව ලියන්න.
2. ඔබ දිව්‍ය සංරක්ෂණය අත්දුටු අවස්ථාවක් ලියන්න.



**ජීවිතයට බිඳක්**

*තැනට සුදුසු ආකාරයෙන් ක්‍රියා කරන්න.*